# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1901/11 - 2015 පෙබරවාරි මස 11 වැනි බදාදා - 2015.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/12/2013

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.06.11 වැනි දිනැති හා අංක 1866/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.05.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නිට්ටඹුව, රන්පොකුණුගම, AA10/26 හි පදිංචි ඩබ්. ජේ. පතිරනරත්න මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් ප්‍රෙටෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.12.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

හේරත් යාපා,  
කම්කරු කොමසාරිස්.

2015 ජනවාරි මස 16 වැනි දින,  
කම්කරු දෙපාර්තමේන්තුව,  
කොළඹ 05.

යොමු අංකය : IR/15/12/2013

කාර්මික අධිකරණයේ දී ය.

ඩබ්. ජේ. පතිරනරත්න මයා,  
AA 10/26, රන්පොකුණුගම,  
නිට්ටඹුව.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය : A/3561 එරෙහිව

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්  
ටර්මිනල්ස් ලිමිටඩ්,  
නිමාව,  
කොලොන්නාව.

*දෙවන පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2014.05.12 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :

"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි B - 1 ශ්‍රේණියේ ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවයේ නියුතු ඩබ්. ජේ. පතිරනරත්න යන අයට සරසවි උයන තොග ගබඩාවට ස්ථාන මාරුවක් ලබාදීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී ඇත්ද යන්නා හා එසේ සිදුව ඇත්නම් ඔහු වෙත ලබාදිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."


1 A – G 20994 — 15 (2015/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත පාර්ශ්වයන් ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව මෙම ආරවුල 2014.08.21 වැනි දින බේරුම්කරණයේ කැඳවන ලදී. එම අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශ්වය වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයට දෙවැනි ප්‍රකාශයක් ගොනු නොකරන බව දැනුම් දෙන ලදී. එදින දෙපාර්ශ්වය විභාගයට සූදානම්ව සිටි හෙයින් ඉල්ලුම්කරුව ප්‍රථමයෙන් සාක්ෂි කැඳවන ලදී. එදින විභාගයෙන් අනතුරුව නැවත විභාගය සඳහා දිනයක් ලබා දෙන ලදී. ඉන් අනතුරුව 2014.12.03 වැනි දින මෙම ආරවුල විභාගයට ගත් අවස්ථාවේදී සමථයක් සම්බන්ධව බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කරන ලදී.

ඉහත සමථය පරිදි ඉල්ලුම්කරුට සරසවි උයන සේවා ස්ථානයේ සිට මුතුරාජවෙල පර්යන්තයට මාරු කර ඇති බවද, එම මාරු කිරීමට අදාළ 2014.11.13 වැනි දින දරන ලිපියේ පිටපතක් සේවා යෝජක බේරුම්කරණයට ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු ඉහත කරුණ බේරුම්කරණයේදී පිළිගන්නා ලදී, එහිදී ඉල්ලුම්කරුට ගමන් වියදම් දීමනාව ගෙවීම සිදු නොකරන හෙයින් ඒ පිළිබඳව අභියාචනයක් කිරීමේ අයිතිය රඳවා ගෙන මෙම ආරවුල සමථයකට පත් වන බව ඉල්ලුම්කරු බේරුම්කරණයට දැනුම් දෙන ලදී. දෙවන පාර්ශ්වයද ඊට එකඟව නඩු ගොනුව අත්සන් කරන ලදී. ඉහත කොන්දේසි මත මෙම ආරවුල සමථයට පත්වීම සාධාරණ හා යුක්තිසහගත බැවින් මෙම ආරවුල සමථයට පත් කරමි.

පී. වීරසේකර,
බේරුම්කරු.

2014.12.23

02-730

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.